**පානදුර ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පානදුර ප්‍රාදේශීය සභාවේ2023දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වයහාමුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේමූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේවාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත්මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කලප්‍රාදේශීය සභාවේකාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාවවිසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේමූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීම සම්බන්ධ වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ පරිච්ඡේද 6.3 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව ගිණුම්ගත කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති වටිනාකම රු.266,798,885ක් වූ ඉඩම් ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ අනුව තක්සේරු දෙපාර්තුමේන්තුව මඟින් තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රමිතියේපරිච්ඡේදය 6.15 ප්‍රකාරව වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමට හා එම අපේක්ෂිත රටාව පිළිබිඹු වන ක්ෂය කිරීමේ ක්‍රමයක් තෝරාගෙන ක්ෂය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හැර අනෙකුත් දේපළ පිරියත හා උපකරණ ක්ෂය කර නොතිබුණි. | කෝම්ප්ට්‍රොලර් ජෙනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සභාව විසින් 2023 අගෝස්තු 14 දින කමිටුවක් පත් කර එම කටයුතු සිදු කරමින් පවතින බව. | ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රමිතියේ පරිච්ඡේද 3.29 හා එහි පරිශිෂ්ඨය 2 හි පහදා දීම් හා මග පෙන්වීම් හි EG 6.2ප්‍රකාරවමුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලද රු.22,000ක්, ණය පොලි ගෙවීම් රු.1,788,867ක් සහ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන නිවැරදිව ගැලපීම් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් ප්‍රදාන නිවැරදිව ගැලපීම් කරනු ලබන බව. | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවල ප්‍රාග්ධන වියදම් ප්‍රදාන සඳහා ලැබී තිබුණු මුදලින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම්වටිනාකමක් ආදායමක් ලෙස හඳුනාගත යුතු වුවද, ආදායම තහවුරු කර නොගෙන රු. 11,820,925 ක් රජයෙන් කල මාරුකිරීම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | ඉදිරියේදී මෙම ගැලපීම් නිවැරදිව සිදු කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේසිට පැවත එන රු.81,000,000ක මුද්දර ගාස්තු නිවැරදි කිරීමේදී එය රු.80,000,000ක් ලෙස රු.1,000,000ක මුදලක් අඩුවෙන් දක්වා තිබුණි. | මුද්දර ගාස්තු සහ උසාවි දඩ යන දෙකෙහිම එකතුව මිලියන අසූඑකක් වන බව. | -එම- |
| (ඇ) | ලැබිය යුතු රක්ෂණ වන්දි අවසාන ශේෂය රු.27,496ක් වුවද, රු.102,496ක් ලෙස රු.75,000ක් වැඩියෙන් දක්වා තිබූ අතර, ලැබිය යුතු රක්ෂණ වන්දිය බැර ශේෂයක් ලෙස දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු විදුලි ගාස්තු - කෙසෙල්වත්ත ශේෂය රු.109,568ක් වුවද රු.7,072ක් ලෙස රු.102,496ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 ගිණුමෙන් ගලපන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 08කට අදාළ ශේෂයක් එයට අදාළ උපලේඛන සමඟ සැසඳීමේදී රු.615,134,871ක වෙනසක් විය. | සොයා බලා 2024 ගිණුම් ගැලපීම් සිදු කරන බව. | වෙනස්කම් වලට හේතු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉදිරියට කළ ගෙවීම් | 105,732 | උප ලේඛන | සොයා බැලීම් සිදුකරමින් පවතින බව. | ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු VAT | 404,142 | උපලේඛන | 2023 වර්ෂයේදී ගෙවිය යුතු මුදල ගෙවනවා වෙනුවට රු. 483,152/- ක බදුගෙවීමක් සිදුකර ඇති බව. | -එම- |
| (ඇ) | ණයගැතියෝ (වාහන රක්ෂණ වන්දි) | 27,496 | උපලේඛන | 2022 වර්ෂයේ මෙම මුදල මෙලෙසම දක්වා ඇති බව. | -එම- |
| (ඈ) | ලැබිය යුතු ගිණුම | 138,276,612 | උපලේඛන | මීට අදාල වාර්තාවක් ඉදිරියේ දී ලබා දීමට කටයුතු කරන බව | -එම- |
| (ඉ) | සභාවේ පෙර ගෙවීම් | 4,300,489 | උපලේඛන | මෙය වසර ගණනාවක් තිස්සේ පැවත එන ශේෂයක් බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 160 වගන්තිය | හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරීම් සිදුකර නොතිබුණි. | හිඟ වරිපනම් ගෙවා නොමැති බදුකරුවන් සඳහා දේපළ තහනම් කිරීමේ කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.76,769,142ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදමරු.5,923,008 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනට හිඟය (රු) | ඇස්තමේන්තු ගත ආදායම (රු) | බිල්කළ ආදායම (රු) | රැස්කළ ආදායම (රු) | දෙසැම්බර් 31දිනට හිඟය (රු) |
| වරිපනම් හා බදු | 29,182,126 | 29,268,870 | 31,053,418 | 38,576,875 | 31,334,126 | 31,593,211 | 17,290,160 | 14,303,051 |
| කුලී | 413,200 | 2,237,767 | 4,376,396 | 2,299,534 | 406,000 | 532,200 | 395,200 | 137,000 |
| බලපත්‍ර ගාස්තු | 634,000 | 488,000 | 518,500 | 44,500 | 512,000 | 494,000 | 479,000 | 15,000 |
| වෙනත් ආදායම් | 13,270,000 | 10,583,600 | 10,572,800 | 54,923 | 2,500,000 | 9,960,000 | 9,960,000 | - |
| එකතුව | 43,499,326 | 42,578,237 | 46,521,114 | 40,975,832 | 34,752,126 | 42,579,411 | 28,124,360 | 14,455,051 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආදායම් ප්‍රගති වාර්තාවට අනුව 2023 ජනවාරි 01 දිනට සමස්ථ හිඟ වරිපනම් ආදායම රු.40,361,423ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.25,321,339ක් හෙවත් සියයට 63ක් අයකර නොතිබුණි. කාල විශ්ලේෂණයට අනුව වසර 10ට වැඩි වරිපනම් රු.3,137,816ක් ද, වසර 05 සිට 09 දක්වා අතර කාලය තුළ රු.6,873,917ක් ද, වසර | වාද්දුව ප්‍රධාන කාර්යාලයේ හා කෙසෙල්වත්ත, තන්තිරිමුල්ල යන උප කාර්යාලවල වර්ෂ 10ට වැඩි වරිපනම් ශේෂය රු.4,732.457ක්ද වර්ෂ 5-9 දක්වා රු.9,009,833ක්ද වන අතර ශේෂය රු.8,988,336ක්බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | 3ක සිට වසර 5ක් අතර කාලය තුළ රු.9,003,501ක් ද හිඟව පැවතුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් වාර්ෂික බිල් කිරීම රු.29,268,870ක් වූ අතර එම බිල් කිරීමෙන් රු.13,255,536ක් හෙවත් සියයට 45ක් සමාලෝචිත වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර රු.50,000ක් ඉක්මවූ වරිපනම් ඒකක 16කින් අයවිය යුතු හිඟ හිටි ශේෂය රු.2,952,995ක් විය. | කෙසෙල්වත්ත, තන්තිරිමුල්ල, වාද්දුව උප කාර්යාලවල 2023 වර්ෂයේ බිල් කිරීම් පිළිවෙලින් රු.9,037,429ක් රු.5,525,219ක් හා රු.14,706,223ක් වූ අතර 2023 වර්ෂයේදී පිළිවෙලින් රු.5,752,228ක් රු.2,602,131ක් හා රු.7,233,057ක් එකතු කර ඇති බව. | ප්‍රවර්තන වර්ෂයේ හා හිඟ ආදායම් අයකර ගතයුතුය. |
| (ඇ) | වරිපනම් සඳහා දේපළ වසර 05කට වරක් තක්සේරු කළ යුතු වුවත්, කෙසෙල්වත්ත හා තන්තිරිමලේ උප කාර්යාල දෙක 2007 වර්ෂයේ සිට හා වාද්දුව උපකාර්යාලය 2014 වර්ෂයේ සිට වරිපනම් සඳහා දේපළ තක්සේරුවක් සිදු කර නොතිබුණි. | උප කාර්යාල තුනෙහිම 2025 සිට නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට නියමිත බව. | වරිපනම් සඳහා දේපළ තකසේරු කළ යුතුය. |
| (ඈ) | ප්‍රගති වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවිය යුතු වෙළඳ ස්ථාන කුලී ආදායම රු.4,438,163ක් වූ අතර ඉන් රු.1,830,800ක් හෙවත් සියයට 41 සමාලෝචිත වර්ෂය තුල අයකර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවිය යුතු වෙළඳ ස්ථාන කුලී රු.4,438,163 ක මුදලින් 2023.12.31 දිනට රු.4,376,396 අය කර තිබුණු බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වාෂරීක ක්‍රියාකාරි සැලැස්ම** | | |
| | වාර්ෂික අයවැය ලේඛනයේ අනුමත රු.මිලියන 34.8ක ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 85.25 ක ප්‍රතිපාදන 2023 **වාෂරීක** ක්‍රියාකාරි සැලැස්ම තුළ ඇතුළත් කර තිබුණි. | වාර්ෂිකව ඇති වන ප්‍රමුඛ අවශ්‍යතා මත මෙවැනි තත්ත්වයක් ඇතිවනබව. | අයවැය ප්‍රතිපාදන අනුව ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුය. |
| (ආ) | **අත්හැර දැමූ කතර්ව්‍යන්** | | |
| (i) | 1998 වර්ෂයේ සිට අවුරුදු 25ක කාලයක සිට පවතින ජල ප්‍රවාහන ගැටළුවක් විසදීම සඳහා ආරම්භ කළ දිබ්බැද්ද | රජයේඉඩමක් අත්පත් කරගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් | ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රඤ්ඥානන්ද මාවතේ කපුගහවත්ත ඉඩමට මායිම් වන රජයේ ඉඩමේ පොදු කාණුව ඉදිකර වැසි ජලය බැස යාමට සැලැස්වීමේ ව්‍යාපෘතිය යටතේ පුද්ගලික ඉඩමක් හරහා දිවයන කාණු කොටස පමණක් රු.253,577ක සභා අරමුදලක් දරා ඉදිකර ව්‍යාපෘතිය අතරමග අතහැර දමා තිබුණි. මේ හේතුවෙන් මාර්ගයේ කාණුවකින් වැසි ජලය පෞද්ගලික ඉඩම් තුලට ගලායෑමෙන් වන හානියට අමතරව වැසි ජලය බැස නොයෑමෙන් මාර්ගයද පරිහරණය කළ නොහැකි වී තිබුණි. | කරන ලෙස ප්‍රාදේශිය ලේකම් උපදෙස් දී ඇතිබව හා මෙම ජලය බැස යාමේ ගැටළුව සඳහා විසඳුම් ලබා දීම වෙනුවෙන් සාධනීය උත්සහයක් මේ වන විට සභාව විසින් දරමින් සිටින බව. | |
| (ii) | කෙසෙල්වත්ත පොදු වෙළඳපල පැරණි ගොඩනැගිල්ල ඉවත් කර නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් 2021 සැප්තැම්බර් 27 වන දින රු.20,000,000ක් ලැබී තිබුණු අතර සෑම මසකම එම ණය මුදල සඳහා පොළී මුදල ලෙස රු.150,000ක් ගෙවිය යුතු විය. ලබා දී ඇති සහන කාලය වර්ෂයකුත් මාස 07 ක් වූ අතර සහන කාලය අවසානයේ වාරික මුදල ගෙවිය යුතු විය. 2022 අප්‍රේල් 26 දින තවත් රු.4,231,000ක ණය මුදලක් දේශීය ණය සංවර්ධන අරමුදලින් ලැබී තිබුණ දපොදු වෙළඳපොලේ ඉදිකිරීම් කටයුතු දැනට අතරමඟ නවතා ඇති අතර ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක්ද සිදු කර නොතිබුණි. | පළාත් පාලන අමාත්‍යාංශ අධ්‍යක්ෂ (සැලසුම්) විසින් පවත්වන ලද විශේෂ රැස්වීම් වාර්තාවට අනුව ව්‍යාපෘතියට අදාලව ඇස්තමේන්තු සකස් කර කඩිනමින් අනුමත කර ගැනීම හා ව්‍යාපෘතියට අදාල කාලරාමු සකස් කර අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලෙසත් විධිමත් ක්‍රමවේදය අනුගමනය කර උපදේශන කමිටුවක් පත්කර ඉදිකිරීම් කටයුතු කළ යුතු බව දන්වන ලද බව හි ඒ අනුව දැනට කටයුතු ආරම්භ කර ඇති බව. | ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සභාව සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති හා අංක LGD/10A/4/න.ගි/2019 දරන ලිපිය අනුව දන්වා | වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනබව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

තිබුණද සභාව විසින් 2023 වර්ෂයේදී ද ඇතැම්ඉඩම්භාගොඩනැගිලි, මංමාවත්,බෝක්කු,පාලම් හා අනෙකුත් යටිතල පහසුකම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පරිහරණය කරනු ලබන වාහනයක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන හතරෙන් තුනක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර ඇති බව. | වාහනය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2024මැයි17 දින වන විට සභාව සතු වාහන 04ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | වාහන 11න් 07ක් දැනට අපහරණය කර ඇති බව හා ඉතිරි වාහන 03 ඉදිරියේදී අළුත්වැඩියා කිරීමට හැකිදැයි පරීක්ෂා කරන බව. | වාහනය අපහරණය කිරීමකඩිනම් කළ යුතුය. |